මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | විදේශ විනිමය දෙපාර්තමේන්තුව |
| දිනය | **2021.01.05** |

## ශ්‍රී ලංකාව තුළ පවතින විදේශ මුදල් සංචිත මට්ටම ආරක්ෂා කරගැනීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග ඉදිරියට පවත්වාගෙන යාම

රට තුළ පවතින විදේශ මුදල් සංචිත මට්ටම ආරක්ෂා කරගැනීමේ අරමුණින් සහ කොවිඩ්-19 (Covid-19) වසංගත තත්ත්වය නිසා ශ්‍රී ලංකාවේ ආර්ථිකය කෙරෙහි ඇතිවිය හැකි සෘණාත්මක බලපෑම සලකා බැලීමෙන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිර්දේශය මත පදනම්ව පාර්ලිමේන්තුවේ අනුමැතිය සහිතව ගරු මුදල් අමාත්‍යවරයා විසින් 2020 ජූලි 2 දිනැති අංක 2182/37 දරන අතිවිශේෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද නියමයෙහි වලංගු කාලය 2021 ජනවාරි 2 දින සිට තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරමින් 2020 දෙසැම්බර් 18 දිනැති අංක 2206/25 දරන ගැසට් නිවේදනයේ පළ කරන ලද නියමය නිකුත් කරන ලදී.

ඒ අනුව ප්‍රාග්ධන ගනුදෙනු සඳහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ මත පනවා ඇති පහත දැක්වෙන සීමාවන් 2021 ජූලි 1 වන දින දක්වා බලපැවැත්වෙනු ඇත.

1. පහත දක්වා ඇති ආයෝජන සඳහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හැර, ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන් විසින් ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා විදේශයන්හි ආයෝජනය කිරීම සඳහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ සඳහා ප්‍රදානය කරන ලද පොදු අවසරය අත්හිටුවීම.

   අ. විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගත් විදේශ ව්‍යවහාර ණය මුදල් මඟින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන,

   ආ. ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්,

   ඇ. ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ.ඩොලර් 20,000 ක උපරිමයක් සඳහා, දැනටමත් විදේශයක පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක් / අරමුදල් යෙදවීමක්,

   ඇ. සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, දැනටමත් විදේශයක පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ.ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා සිදු කරනු ලබන ප්‍රේෂණ.

2. ඕනෑම ප්‍රමාණයක් දක්වා ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ එ.ජ.ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ හැර, ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදු කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවීම.

3. සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව එ.ජ.ඩොලර් 30,000 ක උපරිමයක් දක්වා සීමා කිරීම.

4. සංක්‍රමණික දීමනාවට දැනටමත් හිමිකම් පා ඇති විගාමිකයන් විසින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් සිය රට යැවීම එ.ජ.ඩොලර් 20,000 ක උපරිමයක් දක්වා සීමා කිරීම.

5. පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා එක් එක් ආයෝජනය මත පදනම්ව විශේෂ අවසරයක් ප්‍රදානය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය සතුව පවතින අධිකාරිය, ඉහත 1.අ සහ 1.ආ යටතේ සඳහන් කර ඇති නිර්ණායක සපුරාලන ආයෝජන සඳහා පමණක් සීමා කිරීම.

ඉහත සීමාවන් හඳුනාගත් ප්‍රාග්ධන ගනුදෙනු සඳහා පමණක් අදාළ වන අතර දැනටමත් අවසරලත් ජංගම ගනුදෙනු සඳහා කිසිදු සීමාවක් පනවා නැත.

www.dfe.lk වෙත පිවිසීම මඟින් වැඩිදුර තොරතුරු ලබාගත හැකි ය.